තනතුරම අනතුරුව ?

රජු දක්ස කල ජනයා
නොදකිති සිටින වග රටක් කරවන රජෙක්

හේ හිත්මිං ගිය පසුව
එනු හිසැත ජන මන රංජන රජෙක්
ඉන්පසුව ඔවුහුගෙම ලොමු දැහැ ගන්වන රජෙක්
අනතුරුව ඔවුන්ගේම ගර්හාවට ලක්වන, අකිකරු රජෙක්

විස්වාසය දුර නම් රජුට අන් අය ගැන
අවිස්වාසය ළඟය සියලුදෙනටම රජු ගැන

සූර නායක නෙමේ අඩුවෙන් දොඩකි
අපරිත්සාවෙන්ද නොදොඩකි
තමා වෙනුවෙන්ම මතු කටයුතුද නොකරයි
යන කලෙක කිසිවක්ම නොපනයි
ගිය තැන පළතුණුද නොම වෙයි
සියල්ල සිදුවී අහවර වූ සඳ
ජනයා මෙසේ පවසනු ඇත
"හැම දේම කළේ අපියි"

ඉහතින් දක්වෙන්නේ චීනයේ විසූ දාර්ශනික ලාඕ ට්සු වසර දෙදහස් පන්සියකට පමණ පෙර Tao Te Ching නම් කෘතියේ 17 වන පද්‍යයේ දක්වනු ලැබූ අදහසක අනුවර්තනයකි. මේ අදහස එදා මෙදා තුර ලෝක දේශපාලනය තුළ සත්‍ය වී ඇත. ලංකාවේ රාජ්‍යපාලනය තුළද සත්‍යයක් වී ඇත. ඊටත් වඩා නිදහසින් පසු අප රට කරවූ දේශපාලකයෝ දෙස විමසුම් නුවණින් බලන කල එය තවදුරටත් තහවුරු වේ. ඒ දක්ෂයින්ට වඩා අදක්ෂයින් රට පාලනය කළ නිසාත්, බලය ලබා ගැනීමට ඔවුන් නොකළ දෙයක් නොමැති වූ නිසාත්ය. ලංකාවේ දේශපාලනය දෙස කිසියම් කෙනෙක් විමසිලිමත් වේ නම්, ඔවුනට අන් කවර දෙයකටත් වඩා තම තමන් රඟ දක්වන භූමිකාවන් පිළිබඳව අසාමාන්‍ය දැනුමක් ලබා ගත හැකිය.

එදත්, අදත්, හෙටත් අපි සියලු දෙනාම දේශපාලන විග්‍රහයන්හි ගොදුරු බවට පත්වී සිටිමු. එහෙත් දේශපාලනය යන වචනය ඒ අර්ථ යෙන්ම නොගෙන එහි හැසිරීම් රාටාව ගැන සලකා බැලීමේදී, ගමේ බුලත් විට කඩකාරයාගේ පටන්, පත්තර කාරයා, මරණාධාර සමිති කාරයාගේ සිට ආදිගිෂ්‍ය සමිති කාරයා හරහා, මානව හිමිකම් කාරයා දක්වා සියලු දෙනාම තම තමන්-ගේ දේශපාලන භූමිකාවන් රඟ දක්වනු ලබයි. එහෙත් ඔවුන් ඒ බව නොදනිති. බොහෝ විට මිනිසුන්ට සිතෙන්නේ තමන් නිසා ලෝකය කැරකැවෙන බවය. අවසානයේ සිදුවන්නේ ලෝකය දිගටම කැරකැවෙමින් පවතින අතර බොහෝ අය එක තැන පල්වීමය.

මේ සියලු අටුවා ටිකා ගෙන හැර දැක්වූයේ අන්කිසිවක් නිසා නොව ලංකාවේ වර්තමාන දේශපාලනය මදක් විමසා බැලීමට ලාඕ ට්සු ගේ දර්ශනය අප තුළ කිසියම් කම්පනයක් ඇති කරවනු ලැබීමය. ලාඕට්සේ පවසන පරිදි ශූර නායකයෙක් ඇති කල්හි නායකයෙක් තමන්ට සිටින බව ජනතාවට නොදනේ. ඔහු ඒ තරමට සියුම්ය. මල නොතලන ඛඹරෙකු මෙනි.

එහෙත් කිසියම් නායකයෙක් තුළ තමා යන මතය බලවත් වුවහොත් ඔහුට ඔහුවම පාලනය කර ගැනීම අසීරු වේ. හේ දැඩි ආත්මාභිමානයක්ද ඇති කරගන්නේය. ලෝකයාටද නොයෙක් ආකාරයෙන් තමාගේ කෙරුම් සහ හපන්කම්, අතින් පයින් සහ කටින් පෙන්වයි. ඔහුට බෙහෝ විරුද්ධ වාදියෝ ඇති වෙයි. එවිට සකල විධ ශාස්ත්‍රයන් උපයෝගී කර ගනිමින් එම විරුද්ධ වාදීන්ව මර්දනය කිරීමට එම නායකයා පසුබට නොවෙයි. එකල්හි බොහෝ අය තමන්ට අැගට දැනෙන නායකයෙක් ඇති බැව් දැනගනී. එහෙත් ඒ නායකත්වය වෙනුවෙන් සමාජයකට බොහෝ කැපකිරීම් කිරීමට සිදුවෙයි. ලෙයින්, කඳුළින්, දහඩියෙන් මතු නොව ජීවිත වලින් පවා එම නායකත්වය නඩත්තු කළ යුතු වෙයි. එහෙත් ශූර නායකයා තමන්ගේ නායකත්වය අතින් පයින් සහ කටින් ශක්තිමත් කර ගැනීම පසෙක ලා නායකත්වය තුළින් ඉටුකළ යුතු සේවය පමණක් කරයි. එකල්හි ජනයා සුවපත්ය. තමන් පාලනය වන වගවත් නොදනිති. සියලු දෙනාම නායකයෝ ගැන වද වනවාට වඩා තම තමන් ගේ දේ ගැන පමණක් බලාගනිති. එහෙත් ඒ කෙතරම් කාලයකටදැයි සැක සහිතය.

නිරන්තර වෙනසක් දැකීමට ඇති බලවත් ආශාව මිනිසාගේ සාමාන්‍ය ස්වභාවය ය. ඒනිසාම හැම කෙනෙකුගේම සන්තානවල ජීවත් වෙන කවර හෝ වීරයෙක් වේ නම් ඔහු තම නායකයා වනු දැකීමට ජනයා ඇතැම් විටෙක පෙළෙඹෙයි. විටෙක එම වීරයා සංගීත කාරයෙකි. නැතිනම් නාටකෙකි. මැරයෙක් හෝ හිටපු ජනප්‍රිය චරිතයක පුහෙකු හෝ දියණියකි. එසේත් නැත්නම් පොදුජනතාවගේ පහළම මට්ටමේ සිට ඉහළට පැමිණි චරිතයක් හෝ පූජක වීරයෙකි. නැතිනම් යුධ වීරයෙකි. එසේ නොවේනම් යුධ විරෝධියෙකි. එසේ හෙයින්ම එකල්හි ජනතාව තමන් ආදරය කරන එම චරිතයට නායකත්වයේ ඔවුනු පළඳවනු ඇත. ජනප්‍රිය චරිතයක් යනු බොහෝ විට ආත්ම වර්ණනාව පසු පස පැණි හැළියට ලොබින් දිවයන ඇඹළයන්ට නොදෙවෙනි එකෙකි. ඔවුන්ට මුලු ලෝකයටම වඩා වටින්නේ තමන්-ගේ නළු කම, තමන්-ගේ සංගීතය, තමන්-ගේ ධර්ම දේසනා, තමන්ගේ යුධකාමීත්වය හෝ එවැනි වූ තමන්ගේ අන් දෙයකි. එහෙයින් ඔවුනු තවදුරටත් තමා පුම්බා ගැනීමේ ක්‍රියාවලියක නිරත වන අතර ජනතාවටද තමන්ට නායකයෙක් සිටින බැව් හොඳින් දැනේ. ජනප්‍රියත්වය යන මිණුම් දණ්ඩෙන් ජනතාව සමූහයක් හැරියටට ලබා දෙන දුර්වල තීරණයන් නිසා වැඩි කල් නොයවා ඔවුනු තම තමන්ගේම පස්ඩාත් භාගයන්ට මුසුන් දණ්ඩෙන් වුවද පහර දී ගැනීමට නොපැකිළෙනු ඇත. නායකයා ජනප්‍රිය වීය යුත්තේ නායකත්වයේ ගුණාංග වලින් මිස කටහඬෙන් හෝ ඇඟ පතින් නොවේ?

මීළඟට ජනතාව තවත් විකල්පයන් කරා යනු රිසිව කලාකාරයා හුදෙකලා කිරීමට ත්‍රස්තවාදියෙකුට වුව තම බලය ලබාදෙනු ඇත. නූතන ලෝකයේ ත්‍රස්තවාදය ක්‍රියාත්මක වන ආකාරය වටහා ගැනීමට ඉතා සියුම් ඥානයක් අවශ්‍ය වන්නේය. නූතන ත්‍රස්තයා ජනතාව ගොනාටත් පහළ බුරුවාට පවා අන්දවන්නට දක්ෂය. එම ත්‍රස්තවාදීයාගේ වාග් ලැයිස්තුවේ ඉහළින්ම ඇත්තේ මානව හිමිකම්, පුවත්පත් නිදහස, ගෝලීය ධනවාදයට එරෙහිවීම, ප්‍රජාතන්ත්‍රවාදය, හෞමික අඛණ්ඩතාව, සෛවරී භාවය, සමාජාත්මතාව, වාර්ගික සංහාරය සහ ධර්මිෂ්ඨ සාමාජය වැනි එකී නොකී වචනය. මිනිස්සු එක රොත්තට මේ වචන වලට රැවටෙති. එබැවින් මෙවැනි වචන දොඩන කළ ජනතාව නිතර නිතර ඉගුරු දී මිරිස් ගනිති.

ත්‍රස්තවාදීනු නිල බලයෙන්ද, නොනිල බලයෙන්ද ත්‍රස්තවාදයම වපුරයි. එහි පලම නෙළාගෙන බුදියි. ත්‍රස්තයන්ගේ තරම කොතෙක්ද කියතහොත් තම අමනකම්, මෝඩකම්, නකතීරු, ඔදාවි, චණ්ඩිකම් පවා ප්‍රගතිශීලී යැයි හුවා දැක්වීමට තරම් ඔවුනු නිර්ලජ්ජාශීලීනු වෙති. අවසානයේ ත්‍රස්තවාදියා අනුනුත් මරා තමනුත් මරාගනී. මෙකල්හිද නටපු නැටුම්කුත් නැතිව බෙරේ පලුවක්ද නසා ගෙන ඇත. සකල ජනයා භීතියෙන් මුසපත් කර අවසානයේ අන්තර්ධාන වූ ත්‍රස්තවාදියාගේ තැන ගන්නේ එළොවටත් මෙළොවටත් නැති ජෙන් ජුවන්ලය. නැතිනම් යසළාලකතිස්සලාය.

දත් අපට ඩී.ඇස්, කොතලාවල, එස්. එබලිව්, දහනායක, ඩඩලි, සිරිමා, ජේ.ආර්, ප්‍රේමදාස, විජේතුංග, චන්ද්‍රිකා, රනිල් හා මහින්ද යන චරිත ලාඕට්සුගේ පදය තුළට බහා විමසා බැලීම එතරම් උගහට නොවනු ඇත. ඒ අතරට ප්‍රභාකරන්, විජේවීර, එන්. ඇම්, රංජන් විජේරත්න, ගෝධාභය, වීරවංශ, ටිවිලින් සහ සරත් ෆොන්සේකාද වැනි චරිතයෝද ආදේශ කරමින් බැලිය හැකිය. එකල්හි අප කෙරෙහි වැඩියෙන්ම ඇතිවනුයේ ජුගුප්සාව මුසු අප්‍රසන්නතාවයකි. එය නැති කරගැනීමට ඉහත පදයේ සුභවාදී ප්‍රැන්ත ගැනත් යම්තාක් දුරකට සළකා බැලීම සුදුසු යැයි සිතමු.

දක්ෂ නායකයා වචනයට වඩා ක්‍රියාවන් ගැන විශ්වාසය තබන්නේය. ඒ නිසා ඔහු කටින් බතල සිටුවීම පසෙක ලා සුදුස්සාට සුදුසු තැන දෙයි. එමගින් තම යාන්ත්‍රණය නිසියාකාරව පවත්වාගෙන යයි. ඔවුනොවුනගේ කර්තව්‍ය නිම වන විට අවස්ථානුකූලව ඊට සුදුසු වෙනත් ආදේශකයෙකු පත්කරයි. මේ සියල්ල අවසානයේ ඔහු-ගේ අපේක්ෂාව වන්නේ වඩාත් සුබවාදී සමාජයක් මිස කාඩ්බෝඩ් වීරවරයෙකුගේ චරිතයක් නොවේ. මෙවැනි තත්ත්වයක් පැවතිය හැක්කේ කේතුමතී පුරවරයේ පමණක්ද?

ජනාධිපති ප්‍රේමදාස පෙරුම් පුරා, පෙරුම් පුරා රජ විය. ඔහුව රජ කිරීමේදී ජනතා විමුක්ති පෙරමුණ ප්‍රේමදාස කෝප කිරීමට නොගියේය. ඒ ඉන්දියන් හමුදාව ලංකාවට කැඳවීමට විරුද්ධ වීම යන සිද්ධාන්තය මතය. පසුව ඔහු ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධානත සතුරා විය. ඔහු ඒ තත්ත්වයට කැඳවාගෙන යාමට ජනතා විමුක්ති පෙරමුණද අපමණ සහයක් දුක්වීය. ජවිපෙය චන්ද්‍රිකා-ගේ වාචික පොරොන්දුවකට අවනත වී ජනාධිපති තනතුර වසරකින් අවසන් කර ගැනීමට දිනක නියම කර ගත්තේය. එහෙත් ඔවුන්ට චන්ද්‍රිකාට මුක්තු ගසා සිටින තාක් කල් ඒ බැව් මතක් නොවීය. ඔවුන්ට ඒ ගැන මතක් වී අත්තේ නින්දෙන් නැගි සිට තමන් වත්මන් රජයත් සමග නොසිටින බව පසක් වූ පසුවය. ඔවුන් දන් සැරසෙන්නේ රංජන් විජේරත්නගෙන් ලද සංග්‍රහයට වඩා වැඩි යමක් ලබාගැනීමට විය නොහැකිද? මිනි කරතියාගෙ න ප්‍රදර්ශනය කර කිසියම් සංවිධානයක් බලය ලබාගැනීමට තැන් කරයි නම්, එවැනි සංවිධාන මිනියට ඉහිළින් ප්‍රදර්ශනය කරන්නේ තමන්ගෙ ' නොහැකියාව සහ වංචාව නොවේද? කොටි සංවිධානය අහිංසකයෝ මරා දමීමේ ලෝක ඉතිහාසයේ අති නින්දිතම ආකාරයටය. විටින් විට ඔවුන් හිතා මතා තමන්ගේ අයවද මරා දමීමේ ප්‍රදර්ශනය පිණිසය. අවසාන මොහොතේ තමන් වෙනුවෙන් තරග වදින්නන් පවා මරා දමා තම සංවිධානයට සානුකම්පිත ඡන්ද ලබා ගැනීමට තරම් ශ්‍රී ලංකා දේශපාලන පොරපිටිය පිළිකුල් සහගතය. ජානක පෙරේරාගේ සාතනයේ සත්‍ය පෙනි පෙනී මහින්දට ඇඟිල්ල දික් කළේ එබඳු සානුකම්පිත ඡන්ද වලට කැඳද කමෙනි. සරත් ෆොන්සේකා වැනි අයට දැඩි ආරක්ෂාව ලබා දිය යුතු වන්නේද ඔහුගේ පහනෙන් එළිය බැලීමට විවා රෑ නොබලා වෙහෙසී කටින් බතල හිටවන සිඟාළයන් පිරිසක් කෙළ හළමින් සිටින නිසාමය. ඒ අතර ප්‍රගතිශීලී කඩතුරාවෙන් තම තමන්-ගේ මුහුණු වසා ගෙන සිටින ත්‍රස්ත සිඟාළයෝද නොසිටිනවා විය නොහැකිය.

ප්‍රේමදාස උදාගම් හැදුවේය. එහෙත් ඊට වඩා කටමැත්ත දෙඩව්ය. ඔහුගේ කතා නොරිසිව ජනයා පුද්ගලික රූපවාහිනී නාලිකා වලට බොත්තම් කැරකවීය. ඒ බැව් දැනගත් එතුමා තමන්ගේ කතා සහ ප්‍රවෘත්ති සියලුම රූපවාහිනී මාධ්‍ය වල එකම වේලාවට විකාශනය කිරීමට ආණ කළේය. ජනයා රූපවාහිනී නිවා දමූහ. ඔහුට කිසිවෙකු විශ්වාස නොවීය. එබැවින් කිසිවෙකු හෝ ඔහුවද විශ්වාස නොකළේය. අවසානයේ විශ්වාස නොකළ යුතු අයව විශ්වාස කළ වරදින් ඔහු තම ජීවිතයෙන්ම වන්දි ගෙවීවේය.

මහින්ද ඇත්ගොව්වා ලවා ඇතාව මෙල්ල කර ගත්තේය. ඇතා මෙල්ල කළ ඇත්ගොව්වා ඇතාගේ ස්වාමියා මෙල්ල කිරීමට පෙර සුදුසු තීරණය සුදුසු අවස්ථාවේදී ගනු ලැබීය. එසේ නොකළේ නම් දත් සිදුවන දේ වලට අනුව කුමන දෙයක් සිදු විය හැකිව තිබුණිදැයි කෙනෙකුට සිතාගැනීම අපහසු නොවනු ඇත. මේ සියලු සිදුවීම් ජනතාව මෙන්ම රාජ්‍ය පාලකයාද නොදැන සිටියේ නම් කුමක් විය හැකිව තිබුණිද...? කවුරු කෙසේ කීවත් සහෝදර සමාග මේ අවස්ථානෝචිත ප්‍රඥාව පැසසුම් කට යුතුය. මිනිසුන් කටට ආ පමණින් හිටපු හමුදාපති, ක්‍රීඩා අමාත්‍යාංශයට අනුයුක්ත කිරීම ගැන මැසිවිලි නැගූහ. එහෙත් එසේ නොකළා නම් ? නායකයා සැමවිටම ජනතාවට වඩා ඉදිරියෙන් සිටිය යුතු බවට එයම කදිම නිදසුනක් නොවේද?

වැඩිපුරම අඬඳඹර ඇත්තේ පවුලේ ඇයින් අතරය. එහෙත් එකම පවුළක තිදෙනෙක් එකම අරමුණක් වෙනුවෙන් විවිධ පැතිකඩ ඔස්සේ

37 වන පිටුවට

සාමන්ත තැන්නගේ

මීළඟට ජනතාව තවත් විකල්පයන් කරා යනු රිසිව කලාකාරයා හුදෙකලා කිරීමට ත්‍රස්තවාදියෙකුට වුව තම බලය ලබාදෙනු ඇත. නූතන ලෝකයේ ත්‍රස්තවාදය ක්‍රියාත්මක වන ආකාරය වටහා ගැනීමට ඉතා සියුම් ඥානයක් අවශ්‍ය වන්නේය. නූතන ත්‍රස්තයා ජනතාව ගොනාටත් පහළ බුරුවාට පවා අන්දවන්නට දක්ෂය.

සීගිරි කැටපත් පවුරේ කුරුටු ගියක් ලියූ ගැමියෙක් සීගිරියේ උරුමය තමන්ට පවරා ගනී නම් එය ඔහු-ගේම අනුවන කම මිස අන් කවරක්ද? තමන් පෙළහර පාන සංදර්භය තුළ වීරයෙකු වූ පමණින් ඔහු සමස්ට ය හැසිරවීමේ දක්ෂයෙක් නොවන වග අප විසින් අපටම කියා දිය යුතු පාඩමකි. කොන්දොස්තොර වූ පමණින් දොස්තරකමට නුසුදුසු වන්නාක් මෙනි. තම තමන්ගේ සීමා මායිම් ගැන අවබෝධයක් තිබීම කෙනෙකුට යහපත් මිනිසෙකු මෙන් තමන්ගෙන් සමාජයට ඉටුවිය යුතු යුතුකමක් වෙයිද එය නොපිරිහෙළා ඉටුකිරීමට හේතු වෙයි. තමන්ගේ වපසරිය නොදන්නා කමින් ඔවුන් තමන්ටත්, මුළුමහත් සමාජයටත් කලු පැල්ලමක් සහ අසීමිත කරදරයක්ද ඇති කරයි. වැසිකිලි ශෝධකයා-ගේ පටන් ජනාධිපති දක්වාම දිවෙන වගකීම් සමූදායන් තුළ සිටිය යුත්තේ යහපත් මනුෂ්‍යයෙකු මිස දෙකට තුනට නැමෙන හෝ නොනැමෙන පඹයින් නොවේ.